පාකිස්තානයේ සියල්කොට් හිදී ශ්‍රී ලාංකිකයෙකු ඝාතනය වීමේ සිදුවීම සම්බන්ධයෙන් මාධ්‍ය තුළ පුළුල් ආවරණයක් දක්නට ලැබිණි. ඒ අතර, ඇතැම් මාධ්‍ය තුළ එම ඝාතනයට අදාළ සංවේදී දර්ශන දක්වා තිබිණි. එහිදී ඇතැම් මාධ්‍ය ආවරණ තුළ එම දර්ශන බොඳ කොට දක්වා තිබිණි.

මේ අතර, එම දර්ශන මාධ්‍ය තුළ පළ කළ යුතුද යන්න පිළිබඳව සමාජ මාධ්‍ය තුළද කතිකාවක් ඇතිවී තිබිණි. මියගිය ශ්‍රී ලාංකිකයාගේ පවුලේ අය විසින්ද ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය වෙතින් ඉල්ලා සිටියේ, එම සංවේදී දර්ශන පළ කිරීමෙන් වළකින ලෙසයි.

1) මෙම සිදුවීම සම්බන්ධයෙන් වාර්තා වූ පසුබිමද සැලකිල්ලට ගත් විට, මෙවැනි දර්ශන පළ කිරීම, වාර්ගික සහ ආගමික ප්‍රජාවන් අතර ආතතීන්, ගැටුම්කාරී තත්වයන් ඇතිවීමට හේතු නොවනු ඇතැයි ඔබ සිතන්නේ ද?

1) එම දර්ශන පළ වීම තුළින්, මියගිය අයගේ පවුලේ අයවලුන්ට දිගින් දිගටම අනවශ්‍ය චිත්ත වේදනාවන්ට සහ පීඩාවන්ට මුහුණ දීමට සිදු නොවනු ඇතිද?

2) ඔබ සිතනා ලෙසට, එවැනි සංවේදී දර්ශන නොමැතිව, එම සිදුවීම -එහි බරපතළ භාවය අවධාරණය කරමින්- වාර්තා කිරීමට හැකියාවක් නොතිබුණිද?

දෙසැම්බර් 03,05, 06 සහ 07 දිනයන්හි රූපවාහිනී ප්‍රධාන පුවත් විකාශයන් සහ සිංහල හා ඉංග්‍රීසි පුවත්පත් මෙහිදී නිරීක්ෂණයට ලක්ව ඇත.

(එම සංවේදී දසුන් පළ කිරීමෙන් වළකින ලෙසින් මියගිය ශ්‍රී ලාංකිකයාගේ පවුලේ අය සිදුකළ ඉල්ලීම මෙතැනින්: https://youtu.be/NxRwHyOqDfk?t=589)